චක්‍රලේඛ අංකය: 03/2011

මගේ අංකය / எனது இல. / My No. } එම්13/01/2005

ඔබේ අංකය / உமது இல. / Your No. }

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. } 2889488 / 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. } 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail } rgd@sltnet.lk / rg@rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P.O. Box No. } 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Baththaramulla'

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## பதிவாளர் நாயகம் திணைக்களம்
## REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය / தலைமை அலுவலகம் / HEAD OFFICE

වෙබ් අඩවිය / இணைய தளம் / Web site } www.rgd.gov.lk

දිනය / திகதி / Date : 2011/02/ /

සියළුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

## අතුරුදහන් වූ තැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීම

2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතේ පිටපතක් මේ සමග එවමි. මෙම පනත 2010/12/10 දින සිට වර්ෂ 03ක කාලයක් සඳහා පමණක් වලංගුව පවතී.

02. ශ්‍රී ලංකාවේ ඇති වූ ජාතික මට්ටමේ බරපතල ප්‍රතිවිපාක සහිත "ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් හෝ ජන කැළඹීම් හේතුකොටගෙන උද්ගත වූ සිවිල් කෝලාහලවල දී මියගොස් හෝ අතුරුදහන් වී ඇති තැනැත්තන්ගේ සහ ජාතික ප්‍රමාණයේ ස්වාභාවික ව්‍යසන ඵලව හෝ විපත්ති නිසා මියගොස් හෝ අතුරුදහන් වී ඇති තැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීමට මෙම පනතින් ප්‍රතිපාදන සලසා ඇත. මෙම පනත යටතේ මරණ ලියාපදිංචි කිරීම සඳහා ලැබෙන ඉල්ලුම්පත් භාර ගෙන පරීක්ෂණ පවත්වා, නිර්දේශකර, අදාල කලාපය භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. එබැවින් පනතේ 02 සිට 10 දක්වා වගන්ති කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

03. මෙම පනත යටතේ ලැබෙන ඉල්ලුම්පත් මත ක්‍රියා කිරීමේ දී පහත උපදෙස් අනුව ක්‍රියා කරන ලෙස කාරුණිකව දන්වමි.

### ඉල්ලුම්පත් භාර ගැනීම

(I). ඉල්ලුම්කරු (2 (1)වන හා 10 වන වගන්තිය)

මූලික. පනතේ 2වන වගන්තිය යටතේ මරණ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කළ යුත්තේ මියගිය බවට විශ්වාස කරන පුද්ගලයා ජීවතුන් අතර සිටින්නේ නම්, ස්වභාවිකව ඔහු පිළිබඳව දැන ගත යුතු සහ එම පුද්ගලයා මියගිය බව තරයේ විශ්වාස කරන එම පුද්ගලයාගේ කිට්ටුම ඥාතියෙකු විසිනි. මෙම පනතේ 10 වන වගන්තිය යටතේ අතුරුදහන් වූ අයගේ ළඟම ඥාතියකු හෝ දැනීමක් ඇති යම් තැනැත්තෙකු විසින් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(II) ඉල්ලුම් කළ යුතු ආකාරය (2 (2)වන වගන්තිය)

පනතේ 2 (2)වන වගන්තිය අනුව ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මියගිය පුද්ගලයා අවසන් වරට පදිංචිව සිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙතය. එමනිසා ඔබගේ කොට්ඨාසයේ පදිංචිව සිටි අයගේ ඉල්ලුම්පත් පමණක් භාර ගන්න. (ඇමුණුම 01 අනුව)

(III) ඉල්ලුම්පත් සමග තිබිය යුතු අතිරේක ලියවිලි (3 වන වගන්තිය)

- දිවුරුම් ප්‍රකාශය (ඇමුණුම 02)
- ග්‍රාම නිලධාරීගේ වාර්තාව (ඇමුණුම 03)
- පනතේ 8 වන වගන්තිය ප්‍රකාර පරීක්ෂණ කොමිෂන් සභාවේ හෝ විශේෂ ජනාධිපති කොමිෂන් සභාවේ තීරණයේ සහතික කළ පිටපතක්.

(IV) ඉහත සඳහන් පරිදි විධිමත් හා සම්පූර්ණ ඉල්ලුම්පත් පමණක් භාර ගන්න.

(V) භාරගත් ඉල්ලුම්පත් ඒවා ලද දිනය අනුව අනුක්‍රමික අංක යටතේ සුදුසු ලේඛනයක ඇතුලත් කරන්න. එම ලේඛනයේ පහත සඳහන් විස්තර ඇතුළත් කිරීම උචිතය.

(අ) අයදුම්පත ලද දිනය :

(ආ) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :

(ඇ) මියගිය පුද්ගලයාගේ නම සහ ලිපිනය :

(ඈ) ඉල්ලුම්පතේ පිටපත් ප්‍රදර්ශනය කළ දිනය :

(ඉ) ඉල්ලුම්පතේ පිටපත් ප්‍රදර්ශනය කළ බවට ග්‍රාම නිලධාරී වාර්තාව ලද දිනය :

(ඊ) විරෝධතා ඉදිරිපත් වුයේනම් ඉදිරිපත් කල අයගේ නම සහ ලිපිනය :

(උ) පරීක්ෂණය පැවැත්වූ දිනය :

(ඌ) නිර්දේශ/ ප්‍රතික්ෂේප කල දිනය :

(එ) නිර්දේශ කල ඉල්ලුම්පත සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යැවූ දිනය හා ලියාපදිංචි තැපැල් අංකය :

(ඒ) වෙනත් කරුණු :

ඉල්ලුම්පත් මත ක්‍රියා කිරීම

(I) ඉල්ලුම්පතේ පිටපත් ප්‍රදර්ශනය කිරීම (4 වන වගන්තිය)

(අ) ඇමුණුම 04 අනුව දැන්වීම් පිටපත් 02ක් සකස් කරන්න. ඉන් එක් පිටපතක් ඔබගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන්න. අනෙක් පිටපත (ඇමුණුම 05) අනුව සකස් කල ආවරණ ලිපියක් සමග මියගිය පුද්ගලයා අවසන් වරට පදිංචිව සිටි කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වෙත යවන්න.

(ආ) ග්‍රාම නිලධාරී විසින් ඉල්ලුම්පතේ පිටපත ප්‍රදර්ශනය කළ බවට 05 ඇමුණුමේ පහත කොටස අනුව වාර්තාව ලබා ගන්න. එය ඉල්ලුම්පත සමග ගොනු කරන්න.

(II) විරෝධතා ඉදිරිපත් කිරීම (5 වන වගන්තිය)

(අ) පනතේ 5 වගන්තිය අනුව දිවුරුම් ප්‍රකාශ සමග නියමිත කාලය තුළදී ලැබෙන විරෝධතා පමණක් භාර ගන්න.

(ආ) එසේ භාර ගත් විරෝධතා සම්බන්ධ විස්තර ඉල්ලුම්පත් භාර ගැනීමේ ලේඛනයේ සටහන් කරන්න.

(ඇ) විරෝධතාවය ඉල්ලුම්පත සමග ගොනු කරන්න.

(111). පරීක්ෂණ පැවැත්වීම (8 වන වගන්තිය)

(අ) ඉල්ලුම්පතේ පිටපත් ප්‍රදර්ශනය කළ දින සිට එක් මාසයක් ගතවූ පසු පමණක් පරීක්ෂණය පවත්වන්න.

(ආ) ඉල්ලුම්පතේ සඳහන් කරුණු සනාථ කිරීමට අවශ්‍යයැයි ඔබ අදහස් කරන පුද්ගලයින් පමණක් පරීක්ෂණයට කැඳවන්න. ඉල්ලුම්කරු, ග්‍රාම නිලධාරී සහ මියගිය පුද්ගලයාගේ විස්තර දන්නා තවත් එක් පුද්ගලයකුගේ පමණක් සාක්ෂි සටහන්කර ගැනීම ප්‍රමාණවත් වේ.

(ඇ) විරෝධතා ඉදිරිපත් වී ඇත්නම් විරෝධතා ඉදිරිපත් කළ අය සහ ඔහුගේ සාක්ෂිකරුවන් සිටින්නේ නම් ඔවුන් ද විභාගයට කැඳවන්න.

(ඈ) විභාග දිනයේ දී පළමුව ඉල්ලුම්කරුගේ ද, අනතුරුව ග්‍රාම නිලධාරී සහ ඉල්ලුම්පත සනාථ කරන අනෙක් සාක්ෂිකරුවන්ගේද ප්‍රකාශ සටහන්කර ගන්න.

(ඉ) පණතේ 8 වන වගන්තිය යටතේ කටයුතු කිරීමේ දී කොමිෂන් සභාවල තීරණයේ සහතික කළ පිටපතක් ද ඉල්ලුම් පත්‍රයට අමුණා තිබෙන නිසා තවදුර පරීක්ෂණ පැවැත්වීම අනවශ්‍යය.

[IV] නිර්දේශ කිරීම (8 (2), 10(3) වන වගන්ති)

(අ), මෙම මරණ ලියාපදිංචි කරන්නේ ඔබගේ නිර්දේශය හා ඔබ විසින් සපයනු ලබන සහතිකය මතය. (සහතිකය ඇමුණුම 01 පතුපිටේ ඇත)

(ආ) මරණය ලියාපදිංචි කිරීමට අවශ්‍ය විස්තර ඉල්ලුම්පතේ සඳහන් නොවන එහෙත් සහතිකයේ සඳහන් කළයුතු මෙහි පහත විස්තර පරීක්ෂණයේ දී ලබා ගන්න.

- මරණය සිදුවූ ස්ථානය: "අදාල පුද්ගලයා අවසන් වරට පදිංචිව සිටියේ . . . . . . . . . . . . . . . . . . . . හි ය" යනුවෙන් යොදන්න:
- ජාතිය: මෙහි යෙදිය යුත්තේ ජන වර්ගයයි. එනම් සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ, ශ්‍රී ලංකා යෝනක ආදි වශයෙනි.
- දෙමව්පියන්ගේ සම්පූර්ණ නම්: විමසා සටහන් කරන්න
- මරණයට හේතුව සහ භූමදානය හෝ ආදාහනය කළ ස්ථානය: "අතුරුදහන් වී අවුරුද්දකට වැඩි කාලයක් ගතවී ඇති බැවින් මියගිය බව විශ්වාස කිරීමේ" යන බව යොදන්න. ආදාහනය හෝ භූමදානය කළ ස්ථානය "නොදනී" යනුවෙන් යොදන්න.

- දැනුම් දෙනන්නාගේ සම්පූර්ණ නම පදිංචිය සහ මියගිය පුද්ගලයාට ඇති ඥාති සම්බන්ධතාවය:

අනුමැතිය සඳහා ඉල්ලුම්පත් රෙජිස්ට්‍රාර්ජනරාල් වෙත එවීම

(1) මෙම මරණ ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ කරන ලද ඉල්ලුම්පත් එවිය යුත්තේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි කලාපය භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතය.

(11) ඉල්ලුම්පත් එවීම සඳහා ඇමුණුම් 06 ආකෘතිය භාවිතා කරන්න.

(111) විරෝධතා ඉදිරිපත් වී ඇත්නම් එම ලිපියේ පිටපතක් විරෝධතා ඉදිරිපත් කළ අයට ද යවන්න.

(IV) නිර්දේශකල ඉල්ලුම්පත් සමග වෙනත් කිසිම ලියවිල්ලක් එවීම අනවශ්‍යය. ඒවා ඔබගේ කාර්යාලයේ ගොනුකර තබන්න.

<u>ප්‍රතික්ෂේප කරන ඉල්ලුම්පත්</u>

(1) ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරුණු සත්‍ය බවට ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, එවැනි ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කළ හැකිය.

(11) එසේ ප්‍රතික්ෂේප කරන විට අප්‍රමාදව ඒ බව ඉල්ලුම්කරු වෙත ලිඛිතව දන්වා යවන්න.

(111) එවැනි ඉල්ලුම්පත් කලාපයේ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත එවීම අනවශ්‍යය.

<u>අභියාචනා ( 7 වගන්තිය)</u>

(1) ඔබගේ තීරණයකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ රෙජිස්ට්‍රාර්ජනරාල් වෙතය. එමනිසා ඔබ වෙත ලැබෙන එවැනි අභියාචනා ඒවාට අදාළ ඉල්ලුම්පත්‍රය හා පරීක්ෂණ සටහන් වැනි අනිකුත් ලියවිලි සමග අප්‍රමාදව කලාපය භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යොමු කරන්න.

<u>මරණ ලියාපදිංචි කිරීම</u>

(1) ඔබ විසින් නිර්දේශ කර එවන ඉල්ලුම්පත් මත මරණ ලියාපදිංචි කිරීම සඳහා ඒවා මවිසින් අදාළ කොට්ඨාසයේ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර් වෙත යවනු ලබන අතර, ඒ බව ඔබ වෙතද දන්වා එවනු ලැබේ.

(04) මෙම පනත යටතේ ලැබෙන ඉල්ලීම් මත අති විශේෂ ප්‍රමුඛත්වයක් දී ක්‍රියාකරන මෙන් මෙයින් ඉල්ලා සිටිමි. මේ සඳහා අවශ්‍ය මුද්‍රිත ආකෘති පත්‍ර මේ සමග ඇති ආදර්ශ ආකෘති පත්‍ර අනුව සකස් කර අවශ්‍ය වන පරිදි ප්‍රයෝජනයට ගන්න.

(05) මෙම කරුණු ඔබගේ කොට්ඨාසයේ සේවය කරන සියළුම ග්‍රාම නිලධාරීන් වෙත දැනුම් දෙන්න. ඔවුන් විසින් ඉටුකළ යුතු කාර්යන් නොපමාව ඉටුකර දෙන මෙන් ද, මහජනතාවට මේ පිළිබඳව අවබෝධයක් ලබාදී ඔවුනට සහයෝගය දෙන මෙන් ද ග්‍රාම නිලධාරීන්ට උපදෙස් දෙන්න.

(06) මෙම ලිපිය ලද බව වහාම මා වෙත දන්වා එවන මෙන් ද, අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම සඳහා මාසික ප්‍රගති වාර්තාවක් මා වෙත එවන මෙන්ද කරුණාවෙන් දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඩී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් 1 1) ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.ස.
2) සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් -දැ.ගැ.ස.
3) කලාප භාර සියලුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් -අ.ක.ස.
4) සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් -අ.ක.ස.

ඇමුණුම 08

.................................

ග්‍රාම නිලධාරි,

.................................

20. ........................... දින.

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

.................

<u>2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත -</u>

<u>අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණය ලියාපදිංචි කිරීම</u>

දැනට අතුරුදහන් වී ඇති ..................................................

අය මාගේ කොට්ඨාසයේ ........................................ දරණ තැන අවසන් වරට පදිංචිව සිටි බවත්, ඔහු/ ඇය දැනට එක් අවුරුද්දකට වැඩි කාලයක් තුළ ජීවතුන් අතර සිටින බව ඇසින් නොදුටු බව සහ ආරංචියක් අසන්නට නොවූ බවත් මම මෙයින් තහවුරු කරමි.

ග්‍රාම නිලධාරි,

අංක. ............ කොට්ඨාශය ............

| නිල මුද්‍රාව |
| --- |

ඇමුණුම 04

## දැන්වීමයි

### 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත

ඉහත සඳහන් පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණයක් ලියාපදිංචි කිරීම සඳහා මා වෙත ලැබී ඇති ඉල්ලුම්පත්‍රයේ විස්තර මෙහි පහත සඳහන් කරමි.

02. මෙම මරණය ලියාපදිංචි කිරීමට විරුද්ධතාවයක් ඇතිනම් එම විරෝධතාවය මෙම දැන්වීමේ දින සිට එක් මාසයක් ඇතුළත මා වෙත ඉදිරිපත් කරන මෙන් මෙයින් දන්වමි.

03. විරෝධතා ඉදිරිපත් කිරීමේ දී එම විරෝධතාවය ඉදිරිපත් කිරීමට හේතුව සඳහන් වන විරෝධතා ඉදිරිපත් කරන්නා විසින් සහ වෙනත් එවැනි පුද්ගලයකු විසින් අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය ද විරෝධතාවය සමග ඉදිරිපත් කළ යුතු ය.

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,

. . . . . . . . . . . . . . . . . .

දිනය : . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දිය.

### අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණය ලියාපදිංචි කිරීමට ඉල්ලීම

1. අතුරුදහන් වූ තැනැත්තාගේ සම්පූර්ණ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
2. ස්ත්‍රී පුරුෂ භාවය සහ ජාතිය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
3. වයස: . . . . . . . . . . . . . . . . . . . .
4. මරණය සිදු වූ දිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
5. අන්තිමට පදිංචිව සිටියේ යැයි දන්නා ස්ථානයේ ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . .
6. ස්ථිර පදිංචිය දැරූ ස්ථානය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
7. පදවිය හෝ වෘත්තිය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
8. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම සහ පදිංචි ස්ථානය: . . . . . . . . . . . . . . . . . . . . . . . . .
9. අතුරුදහන් වූ තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධතාව: . . . . . . . . . . . . . . . . . . . . . .

ඇමුණුම 05

මගේ අංකය:

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,

. . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . .

20. . . . . . . . . . . . . . . . . දින.

ග්‍රාම නිලධාරී,

. . . . . . . . . . . . . . . . . .

<u>අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණයක් ලියාපදිංචි කිරීම</u>

2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . ගේ මරණය ලියාපදිංචි කිරීම සඳහා . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . පදිංචි . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . විසින් මා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් මේ සමඟ එවමි.

02. කරුණාකර එය ඔබේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ සති දෙකක කාලයක් ප්‍රදර්ශනය කරන්න. ඉන්පසු ඒ බව මෙහි පහත සඳහන් ආකෘතියේ මා වෙත වාර්තා කරන්න.

ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

---

ඔබේ අංකය:

. . . . . . . . . . . . . . . . . . . . . . .

20. . . . . . . . . . . . . . . . . . . . . . දින.

ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

. . . . . . . . . . . . . . . . . . . . . . .

<u>අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණයක් ලියාපදිංචි කිරීම</u>

ඔබේ අංකය . . . . . . . . . . . . . . . . . . සහ . . . . . . . . . . . . . . . . . . දින දරණ ලිපිය සමඟ එවන ලද 2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන ) පනත යටතේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . ගේ මරණය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත 20. . . . . . . . . . . . . දින සිට 20. . . . . . . . . . . . . දින දක්වා මගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන ලද බව මෙයින් වාර්තා කරමි.

. . . . . . . . . . . . . . . . . .
ග්‍රාම නිලධාරී
කොට්ඨාසය: . . . . . . . .

| නිල මුද්‍රාව |
| --- |

ඇමුණුම 06

මගේ අංකය:

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය.

. . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . .

20. . . . . . . . . . . . . . . . . දින

සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (කලාප)

. . . . . . . . . . . . . . . . . .

<u>අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණයක් ලියාපදිංචි කිරීම</u>

2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .ගේ මරණය ලියාපදිංචි කිරීම සඳහා . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . පදිංචි . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . මහතා /මහත්මිය විසින් මා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පතක් මේ සමග එවමි.

02. එම මරණය ලියාපදිංචි කිරීම මා විසින් නිර්දේශකර ඇති අතර, මරණය ලියාපදිංචි කිරීමේ දී, ඇතුළත් කල යුතු විස්තර ද මගේ සහතිකයේ යොදා ඇත.

03. මෙම මරණය ලියාපදිංචි කළයුතු රෙජිස්ට්‍රාර්වරයාගේ විස්තර මෙසේය.

රෙජිස්ට්‍රාර්වරයාගේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

කොට්ඨාසය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . .

ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

පිටපත : ඉල්ලුම්කරු වෙත දැනගැනීම සඳහා